# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,881 — 1962 ජනවාරි 18 වැනි බ්‍රහස්පතින්ද — 18.1.1962

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී).


## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම්:— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම:— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:— | | | — |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 27 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | 32 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | | ... | 33 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ, යටිගංහුලහ දකුණ ගම්මුලාදෑනි කොට්ඨාශයේ, පිටවල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණවූ ගාලගෙදරවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:—

උතුරට: පන්දෙනි ඇල සහ ගිනිගත්හේන-යටියන්තොට ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: රඹුක්පත් ඔය සහ පන්දෙනි ඇල; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: ගිනිගත්හේන-යටියන්තොට ප්‍රසිද්ධ පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය: ජේ. 60/61 ඊ 27-ඇල්.ඕ./ඒ 133.

1961 නොවැම්බර් මස 28 දින,
කොළඹ දීය.

1 - 624

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම් පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍ය්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙසින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩගම වසමේ මහරතැන්න ගමේ පිහිටි කඩුකැපුමේ වත්ත නමැති ඉඩමෙන් අ. 0, රු. 2, ප. 00 ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—

උතුරට : කේ. ජී. පුංචා සහ තවත් අය අයිතිකම් කියන කරනාදුර ගෙදරවත්ත නොහොත් කඩුකැපුමේවත්ත සහ ගම්සභා පාර ; නැගෙනහිරට : යූ. ජී. පෙරේරා අයිතිකම් කියන කඩුකැපුමේවත්ත සහ ගම්සභා පාර ; දකුණට : නාරන්පනාවට යන ප්‍රසිද්ධ මහ පාර ; බස්නාහිරට : ජී. නන්දසේන සහ තවත් අය අයිතිකම් කියන මඩුගස්තැන්න සහ කේ. ව්කිරා සහ තවත් අය අයිතිකම් කියන පාණ්ඩියවත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ. 57/58 ඇල්ජී. 289/ඇල්ඞී./ඞී. 8.

1961 දෙසැම්බර් මස 26 දින,
කොළඹ දීය.

1-625

---

## 1954 අංක 39 දරණ රජයට ඉඩම් අත්ක්‍ර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950හේ අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙසින් ප්‍රකාශ කරමි.

1. මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොටසේ, උතුරු කඩ වීදිය ගම්මූලාදෑනි වසමේ, මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුළ, අංක 11 දරණ නාගරික කොට්ඨාශයේ, ඇල්වේල්ල පාරේ වරිපණම් අංක 54 දරණ, ප්‍රමාණයෙන් අක්කර හතරක් පමණවූ තිලකරත්න වලව්වෙවත්ත නමැති ඉඩමට මායිම් :—

උතුරට : එදිරිව්චාරිගේ පින්හේරිස් හිමිකම් කියන එම ඉඩමේ බෙදා වෙන්කළ වරිපණම් අංක 58 දරණ ඉඩම ; නැගෙනහිරට : වරිපණම් අංක 112 දරණ සුජාතා විද්‍යාලය සතු ඉඩම ; දකුණට : ඞී. ජේ. රනවීර හිමිකම් කියන වරිපනම් අංක 114 දරණ පොකුණෙවත්ත නමැති ඉඩම ; බස්නාහිරට : ඇලවේල්ල පාර.

2. මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ, උතුර කඩවීදිය ගම්මූලාදෑනි වසමේ, මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුළ, අංක 11 දරණ නාගරික කොට්ඨාශයේ, රාහුල පාරේ, වරිපණම් අංක 114 දරණ ප්‍රමාණයෙන් අ. 0, රු. 0, ප. 15 පමණවූ පොකුණෙවත්ත නමැති ඉඩමට මායිම් :—

උතුරට : වරිපණම් අංක 54 දරණ ඞී. ජ්. රණවීර හිමිකම් කියන තිලකරත්න වලව්වෙවත්ත නමැති ඉඩම (අත්කර ගැනීමට අදහස් කර ඇති) ; නැගෙනහිරට : සුජාතා විද්‍යාලයට වැටි ඇති පාර ; දකුණට : රාහුල පාර ; බස්නාහිරට : වරිපනම් අංක 114 දරණ එම ඉඩමේ කොටසක්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 60/61 ඊ 263/එල්. බී. 2481.

1961 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

1-583

---

## 1954රේ අංක 39 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත කරන ලද 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයයි

පහත විස්තර කෙරෙන ඉඩම් මහජන කාය්‍ය්‍යයක් සඳහා අවශ්‍යය බැවින් ඉහත සඳහන් පනතෙ විධිවිධාන යටතේ එය අත්කරගනු ලබන බව කෘෂිකම්, ඉඩම්, වාරිමාගී සහ විදුලි බලය පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, එකී පනතේ 5 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙසින් ප්‍රකාශ කරමි.

යාපනය දිසාවේ, පච්චිලාපලෙයි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පුලෝපලෙයි, තම්බගාමම් සහ වන්නාන්කනි නමැති ග්‍රාමවල පිහිටි ඉනාසිමනල්කාවු නමැති පහත සඳහන් අයුරු මායිම්ව ඇති ඉඩම් කැබැලි 6 කි :—

**1 වන කොටස—ග්‍රාමය : පුලෝපලෙයි—ප්‍රමාණය : අක්. 1, රූඩ් 0, පර්චස් 10.**

උතුරට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම ; නැගෙනහිරට : පී. නාගනාතන් හිමිකම් කියන ඉඩම් කොටස ; දකුණට : එස්. සෙතුකාවලර් හා උදවිය හිමිකම් කියන ඉඩම් ; බටහිරට : ප්‍රසිඹ පාරකි.

**2 වන කොටස—ග්‍රාමය : තම්බගාමම්—ප්‍රමාණය : අක්. 0, රූඩ්ස් 0, පර්චස් 18.5.**

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටසක් ; නැගෙනහිරට : කරත්ත පාරකි ; දකුණට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම්ද ; බටහිරට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් ද.

**3 වන කොටස—ග්‍රාමය : වන්නාන්කනි—ප්‍රමාණය : අක්. 0, රූඩ්ස් 1, පර්චස් 10.8.**

උතුරට : එඩ ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : මුරුගන් වයිරවාන් සහ තවත් අයෙක් හිමිකම් කියන ඉඩමේම කොටසක් ; දකුණට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම ; බටහිරුට : කරත්ත පාර.

**4 වන කොටස—ග්‍රාමය : වන්නාන්කනි—ප්‍රමාණය : අක්. 0, රූඩ්ස් 1, පර්චස් 11 කි.**

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : කරත්ත පාර ; දකුණට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම ; බටහිරට : අරිය මලර් මුරුගේසුපිල්ලෙයි හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක්.

**5 වන කොටස—ග්‍රාමය : වන්නාන්කනි—ප්‍රමාණය : අක්. 0, රූඩ්ස් 2, පර්. 0 කි.**

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : මුත්තයියා මාර්කන්ඩු හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක් ; දකුණට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් ; බටහිරට : කරත්ත පාර.

**6 වන කොටස—ග්‍රාමය : වන්නාන්කනි—ප්‍රමාණය : අක්. 0, රූඩ්ස් 1, පර්චස් 13.2 කි.**

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : එස්. පොන්නන් හිමිකම් කියන ඉඩම ; දකුණට : දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් ; බටහිරට : වයිර මුත්තු හිමිකම් කියන මෙම ඉඩමේම කොටස (අත්කර ගැනීමට යන).

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

මේ සම්බන්ධයෙන් සඳහන් කළයුතු :—

අමාත්‍යාංශ අංක : ජේ 59/60 ඊ 524,

දිසාපති තැනගේ අංකය : එල්. ඒ. 1183

1961 නොවැම්බර් මස 10 දින,
කොළඹ දී ය.

1-563

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙසින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශිය, ආදායම් නිලධාරි කොට්ඨාශයේ ආසිදෙනිය වසමේ ගලිගොමුව ගමේ පිහිටි අඹන්පිටිය වත්ත නැමති ඉඩමෙන් අ. 0, රූ. 2, ප. 0 පමණ ප්‍රමාණය ඇති කොටසට මායිම් :—

උතුරට : එච්. ඒ. පිංචි අප්පුහාමි අයිතිකම් කියන එගොඩවත්තේ හේන නොහොත් කිරිවානාහේන ; නැගෙනහිරට : අඹන්පිටිය වත්තේ කානුව ; දකුණට : ඇස්. ඩබ්ලිව්. පෙරේරා සහ තවත් අය අයිතිකම් කියන කිරිවානාහේන ; බස්නාහිරට : ඇම්. වී. ගුණසේකර සහ තවත් අය අයිතිකම් කියන පත්තන්පියවත්ත සහ කොහුඅඹේහේන.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 60/61 එල්. ජී. 339.

1961 දෙසැම්බර් මස 21 දින,
කොළඹදීය.

1-533

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

හලාවත දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, ගල්මුරුව ගම් මුලාදෑනි වසමේ, දුම්මලසූරිය ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණ වූ, පොතුවටවන වත්ත නැමැති බිම් කොටසට මායිම් :—

උතුරට : මාදම්පේ-කුරුණෑගල ප්‍රසිද්ධ පාර ; නැගෙනහිරට : සී. ඒ. ලැම්බර්ට් ද සිල්වා හිමිකම් කියන ග්‍රේස්ලෑන්ඩ් වත්ත නමැති ඉඩම ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : බොරළු පාර සහිත එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 59/60 ඊ 464.—ඇල් ඒ. 3793.

1961 දෙසැම්බර් මස 13 දින,
කොළඹදීය.

1-533 A

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, උඩුව වසමේ, උඩුවක ගමේ පිහිටි ප්‍රමාණයෙන් රූඩ්ස් 2 ක් පමණ වූ ගොරක්ගහමූල නැමති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : උඩුවක සිංහල මිශ්‍ර පාසැලේ ඉඩම (රජය සතු) ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේ (ගොරොක්ගහමූල හේනේ) ඉතිරි කොටස ; දකුණට : ඉඳුරාගේ රාළලාගේ ඇඩ්වින් සිංඤෝ මහතා සහ තවත් අය හිමිකම් කියන කොටඅඹුහේන නමැති ඉඩම (අත්පත්කරගැනීමට අදහස් කරන ඉඩම).

කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, උඩුවක වසමේ, උඩුවක ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර එකක් පමණ වූ කොටඅමුනේහේන නමැති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : එස්. ඒ. හෙන්දිරික් සිංඤෝ සහ තවත් අය හිමික්ම් කියන ගොරොක්ගහමූලහේන (අත්පත් කරගැනීමට අදහස් කරන ඉඩම) ; නැගෙනහිරට, බස්නාහිරට සහ දකුණට : එම ඉඩමේ (කොටඅමුහේනේ) ඉතිරි කොටස්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 60/61 ඊ. 186.

1961 දෙසැම්බර් මස 11 වන දින,
කොළඹදීය.

1-534

---

අංකය : කච්. ඩී. 101/කච්. ඒ. 480.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික ප්ලෑනයේ අංකය : පී.පී.ඒ. 4,817. ගම—පට්ටිගොඩ.

**කෑබැල්ල : 1.**

ඉඩමේ නම : කහටගහවත්ත ; විස්තර : අවුරුදු 10-15වූ පොල් ගස් 3ක්, අවුරුදු 5-7වූ පුවක් ගස් 5ක්, අවුරුදු 1-2වූ පුවක්ගස් 6ක්, අවුරුදු 2-3වූ කිතුල්ගසක් සහ අඩිපාරක කොටසක් ඇති ඉඩම ; අයිතිකම් කියන අය : ඩබ්ලිව්. කේ. පීටර් සිංඤෝ, පට්ටිගොඩ, වේයන්ගොඩ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.4.

**කෑබැල්ල : 2.**

ඉඩමේ නම : කදුරුගහවත්ත ; විස්තරය : අවුරුදු 8-12 වූ කොස් ගස් 3ක්, අවුරුදු 15-20 වූ පොල්ගසක්, අවුරුදු 5-8 ක්වූ කජුගසක්, අවුරුදු 6-10 ක්වූ පුවක්ගස් 6ක්, අවුරුදු 1-2 වූ පුවක්ගස් 4ක් සහ අඩිපාරක කොටසක් ඇති ඉඩම ; අයිතිකම් කියන අය : ඩබ්ලිව්. කේ. මැසිනෝනා, පට්ටිගොඩ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 03.9.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1962 මාර්තු මස 1 වැනි දින පූ. භා. 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 වූ පෙබරවාරි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඊ. පද්මනාදන්,
කොළඹ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962ක් වූ ජනවාරි මස 9 වැනි දින,
කොළඹ කච්චේරිය.

1-487

---

## 1954 අංක 39 දරණ රජයට ඉඩම් අත්ක්‍ර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950ශේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950ශේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූලික සිතියම් අංක ඒ. 4,752 ගම—කොටදෙනියාව

**කැබලි අංකය : 1.**

නම : බර්ච්ටන් වත්ත ; විස්තර : අවු. 30-50ක් පමණ වයස පොල් ඉඩම, ගල සහ ගල සහිත අවු. 30-50 පොල් ඉඩම ; හිමිකම් කියන අය : ඒ. ඇස්. අමරදාස, සීමාසහිත ඒ. ඩී. අප්පුහාමි සහ පුත්‍රයෝ බාරේ, 52, මුහුදු වෙරළ පාර, පිටකොටුව ; ප්‍රමාණය ; අ. 14, රූ. 3, ප. 21.

**කැබලි අංකය : 2.**

නම : ඇල ; විස්තර : ඇල ; හිමිකම් කියන අය : ඒ. ඇස්. අමරදාස, සීමාසහිත ඒ. ඩී. අප්පුහාමි සහ පුත්‍රයෝ බාරේ, 52, මුහුදු වෙරළ පාර, පිටකොටුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 6.

**කැබලි අංකය : 3.**

නම : බර්විත්වත් වත්ත; විස්තර : පොල් ඉඩම; හිමිකම් කියන අය : ඒ. ඇස්. අමරදාස, සීමා සහිත ඒ. බී. අප්පුහාමි සහ පුත්‍රයෝ බාරේ 52, මුහුදුවෙරළ පාර; පිටකොටුව; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.

**එකතුව : අ. 15, රූ. 0, ප. 0.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 පෙබරවාරි මස 27 දින පෙරවරු 9.30 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 පෙබරවාරි මස 20 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම්වලට තම තමන්ගේ ඇති අයිතිය පෙන්වීමට ඇති ඔප්පු හා වෙනත් ලියකියවිලි ඇතොත් ඒවා මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

බී. සී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති.

වෂ් 1962 ක්වූ ජනවාරි මස 11 දින,
කොළඹ කච්චේරියේදීය.

1-590

---

සඳහන් අංකය : කැපුබී. 544/කැපුඒ. 280.

## 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මූලික සිතියම් අංක ඒ 4773-හේන්පිටගෙදර සහ හපුවලාන ගම්

**හේන්පිටගෙදර ගම**

**කැබලි අංකය :1.**

නම : ගලකුඹුර පිටලියද්ද; විස්තර : වේල්ලක කොටසක් සහිත කුඹුර; හිමිකම්කියන අයගේ නම් : දිවුලපිටියේ, හේන්පිට ගෙදර තෝමස් පෙරේරා සකලසූරිය; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 09.5.

**කැබලි අංකය : 2.**

නම : ගලකුඹුර පිටලියද්ද; විස්තර : වේල්ලක කොටසක් සහිත කුඹුර; හිමිකම්කියන අයගේ නම් : දූනගහ හේන්පිටගෙදර පටපිලිගේ ගබ්රියෙල් ප්‍රනාන්දු, පටපිලිගේ ජෝන් ප්‍රනාන්දු, පටපිලිගේ චාර්ලිස් ප්‍රනාන්දු; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 07.2.

**කැබලි අංකය : 3.**

නම : ඊරියගහකුඹුර පිටලියද්ද; විස්තර : වේල්ලක කොටසක් සහිත කුඹුර; හිමිකම්කියන අයගේ නම : හුනුමුල්ලේ කැලැපිටිමුල්ලේ ඉඹුලාන අප්පුහාමිලාගේ හරමානිස් අප්පුහාමි; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 00.9.

**හපුවලාන ගම**

**කැබලි අංකය : 4.**

නම : ඊරියගහකුඹුර පිටලියද්ද; විස්තර : වේල්ලක කොටසක් සහිත කුඹුර; හිමිකම් කියන අයගෙ නම් : දිවුලපිටියේ හේන්පිට ගෙදර අදිකාරි පතිරන්නෙහෙලාගේ ජේන් නෝනා; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 07.8.

**කැබලි අංකය : 5.**

නම : ඊරියගහකුඹුර පිටලියද්ද; විස්තර : කුඹුර; හිමිකම් කියන අයගේනම් : දිවුලපිටියේ හපුවලානේ ගණිහිගම පතිරන්නෙහෙලාගේ සරදියෙල් පෙරේරා; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 00.2

**කැබලි අංකය : 6.**

නම : ඊරියගහකුඹුර; විස්තර : වේල්ලක් සහිත කුඹුර; හිමිකම් කියන අයගේ නම් : දූනගහ, සායක්කාරමුල්ලේ තනිප්පුලිගේ සයිමන් ප්‍රනාන්දු; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 09.1.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 පෙබරවාරි 22 වැනි දින පූ. භා. 10.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 පෙබරවාරි 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් ඇනුම්දිය යුතුයි. මෙම ඉඩම්වලට ඇති අයිතිය පෙන්වීමට ඇති ඔප්පු හා වෙනත් ලියකියවිලි මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

බී. සී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති.

1962 ජනවාරි 10 වැනි දින,
කොළඹ කච්චේරිය.

1-589

---

සඳහන් අංකය : කැපුබී. 515 කැපුඒ. 666.

## 1954 අංක 39 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරන රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියම් අංක ඒ. 4825—මිනුවන්ගොඩ සුළු නගර සභාවේ කොට්ඨාශ අංක 3.

**කැබලි අංකය : 1.**

නම : වේයන්ගොඩ පාරේ වරිපනම් අංක 71 සහ 73 දරන කල්දේරම් වත්ත; විස්තර : අවුරුදු 30ට වැඩි පොල් ගස් 66, අවුරුදු 15ක් වයස කොස් ගස් 2යි, අවුරුදු 2-5 ක් වයස පොල් පැළ 6යි, බෙලෙක් තහඩු වලින් වසන ලද වහලය සහිත ගොඩනැගිල්ලක්, කපරාරු කළ කණුවගයක් හා කපරාරුකළ අත්තිවාරමක කොටසක් සහිත පොල් ඉඩම; හිමිකම් කියන අය : කොළඹ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ, බොරැල්ල, කොළඹ; ප්‍රමාණය : අ. 1, රූ. 0, පා. 03.9.

**එකතුව : අ. 1, රූ. 0, පා. 03.9.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මාර්තු මස 6 වෙනි දින පෙරවරු 9.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 පෙබරවාරි මස 25 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. මෙම ඉඩම්වලට ඇති අයිතිය පෙන්වීමට තිබෙන ඔප්පු හා වෙනත් ලියකියවිලි මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

බී. සී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති.

1962 ජනවාරි මස 11 දින,
කොළඹ කච්චේරියේදීය.

1-592

## 1954 ජේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : ඉට/2/76 සහ 84.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බව 1954ජේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

පොදු කටයුත්ත :— අංගගොඩ නිවාස යෝජනා ක්‍රමය සඳහා රජයට ඉඩම් අත්කර ගැනීම.

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන් විසින් ඔහුගේ 1959.2.27 දින හා 61.6.9 වැනි දින අංක ජේ. 57/58 එස්/259 හා ජේ/57/58එස්/686 දරණ ප්‍රකාශනයෙන් තීරණයකර, අංක 11,680 හා 12,460 දරණ රාජ්‍ය නිවේදන පත්‍රයෙන් ගි පළ කරන ලද පරිදි ලබා ගැණීමට බලාපොරොත්තුවනු ලබන ඉඩම්වල විස්තරය :

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :**—බටහිර බෙන්තර වල්ලවිටි කෝරලය.

**ගම්මුලාදෑනි වසම :**—අංගගොඩ **ගම :**—පිටරබ

**පිඹුරු අංකය :**—පී. පී. ඒ. 1899

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : හේනගෙ වත්ත ; විස්තරය : පොල්ගස් 140ක්, කිතුල්ගස් 3ක්, කොස්ගස් 4ක්, කජුගස් 2ක්, අඹගස් 2 ක්, දෙල් ගස් 2ක්, ගොරකගස් 2 ක්, කොහොඹ ගසක්, හික්ගස් 1 ක්, මදටිය ගස් 1ක්, මුනමල් ගස් 1ක්, දොඹගස් 1 ක්, කොට්ටන් ගස් 1 ක්, ස්ථිරගොඩනැගිල්ලක් (වැසිකිලි පේලියක්) වතුර ටැංකියක්, බැම්මෙන් බැඳි ළිඳක්, තවත් ළිඳක් සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 18.9.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : අම්බලන්ගොඩයවත්ත ; විස්තරය : පොල්ගස් 28ක් සහිත පොල් ඉඩම ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 05.6.

**කැබලි අංකය : 3.**

ඉඩමේ නම : විදානගේවත්ත ; විස්තරය : පොල්ගස් 268 ක්, කොට්ටන් ගසක් මැටියෙන් තැනූ, අතුසෙවිලි, තාවකාලික ගොඩනැගිල්ලක් හා බැම්මෙන් බැඳි ළිඳක් සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 2, රූ . 1, ප. 05.0.

**කැබලි අංකය : 5.**

ඉඩමේ නම : පුවක්අරඹගෙවත්ත ; විස්තරය : පොල්ගස් 11 ක් හා ගොරක ගසක් සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.8.

**කැබලි අංකය : 6.**

ඉඩමේ නම : වලව්වත්ත ; විස්තරය : පොල්ගස් 22 ක්, දෙල්ගස් 2 ක් සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 37.8.

**කැබලි අංකය : 7.**

ඉඩමේ නම : ගෙදරවත්ත ; විස්තරය : පොල්ගස් 8 ක් හා පොල් පැල 2කින් යුත් ඉඩම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.8.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් නියෝජිතයින් හෝ 1962 මාර්තු මස 24 වැනි දින පූ. භා 10.30 ට බෙන්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 මාර්තු මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සම්බන්ධයත් එකී ඉඩම් අත්කර ගැණීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයිතිවාසිකම් ස්ථිර කිරීමට අදාළවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

අංක ඒ 1899 දරණ මූලික සැලැස්මේ පිටපතක් බැලීම සඳහා අංගගොඩ ගම්මුලාදෑනි තැනගේ කාර්යාලයේ තැන්පත් කර ඇත.

ඒ. එස්. නවරත්නරාජා,
ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කරගැණීමේ
නිලධාරිතැන.

ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී ය.
1962 ජනවාරි මස 8 වැනි දා,

1-460

## 1954ජේ අංක 39 දරණ රජයට ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධනය කළ පරිදි වූ 1950 අක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය : එල්. අයි/ඒසී/33.

මහජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

ප්ලෑන් නො. පීපීඒ. 2282

ගම :—මහකච්චාකොඩිය ගම, වවුනියාව දකුණ (සිංහල) .

**ඉඩම් කැබලි නො. 1.**
ඉඩමේ නම : කොටුවල ; විස්තර : කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : ශූ. බී. සිරිවර්ධන සහ වී. පුංචිබණ්ඩා, මහකච්චාකොඩිය, මාමඩුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.2.

**ඉඩම් කැබලි නො. 2.**
ඉඩමේ නම : කොටුවල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : ශූ. බී. සිරිවර්ධන සහ වී. පුංචිබණ්ඩා, මහකච්චාකොඩිය, මාමඩුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.7.

**ඉඩම් කැබලි නො. 3.**
ඉඩමේ නම : කොටුවල ; විස්තරය : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : කේ. ටිකිරිබන්ඩා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.0.

**ඉඩම් කැබලි නො. 4.**
ඉඩමේ නම : කොටුවල ; විස්තරය : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : කපුරාලගේ මැතික්රාල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.7.

**ඉඩම් කැබලි නො. 5.**
ඉඩමේ නම : කොටුවල ; විස්තරය : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : කපුරාලගේ බන්ඩා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.7.

**ඉඩම් කැබලි නො. 6.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : කොක්කුමඩුවේ පඤ්ඤානන්ද සථවිර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප.15.1.

**ඉඩම් කැබලි නො. 7**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : ශූ. පුන්චිරාල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.4.

**ඉඩම් කැබලි නො. 8**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : වන්නිහාමිගේ අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.3.

**ඉඩම් කැබලි නො. 9.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : වන්නිහාමිගේ අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.5.

**ඉඩම් කැබලි නො. 10.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : ශූ. පුන්චිරාල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.1.

**ඉඩම් කැබලි නො. 11.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : වී. පුන්චිරාල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.7.

**ඉඩම් කැබලි නො. 12.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : වන්නිහාමිගේ අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.2.

**ඉඩම් කැබලි නො. 13.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : වන්නිහාමිගේ අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.8.

**ඉඩම් කැබලි නො. 14.**
ඉඩමේ නම : පන්සල්ගොඩවෙල ; විස්තර : වාරිමාර්ග ඇල සහිත කුඹුර ; අයිතිකම් කියන්නාගේ නම : අඹරාතගේ උඩයාර් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.1

**එකතුව** අ. 0, රූ. 3, ප. 20.5.

අත්කර ගැනීමට අදහස් කරන ඉහතකී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962ක් වූ මාර්තු මස 8 දින පෙරවරු 9 ට මහකච්චාකොඩිය ග්‍රාම සංවර්ධන සමිතිශාලාවේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 ජනවාරි මස 29 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

නි. බ. මා. සෙනෙවිරත්න,
වවුනියා දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

වව්නියාවේ කච්චේරිය,
1962 ක්වූ ජනවාරි මස 4 වැනි දාය.

1-432.

---

අංකය—එල් ඒ 14 (ඒ.පී.බී)

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධන කරන ලද පරිදි 1950 යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

අත්කර ගැනීමට ඇති ඉඩමේ විස්තර :—

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බටහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අනුරාධපුර නාගරික මූලාදෑනි තැනගේ වසමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ්. 3, පර්. 25.5 ක් පමණවූ සර්වේයර් ජනරාල් තැන වෙත තිබෙන ලංකා මැනුම් ගම් සිතියම් අංක 1398 වේ කැබලි අංක 41 යනුවෙන් දක්වා ඇති ඉඩම.

ඉඩමේ නම : නාගරික කොට්ඨාශ අංක 8 වේ සුන්හත පාරේ වරිපනම් අංක 2 හා 4 දරණ ශාන්ත ඇන්ඩෲ දේවස්ථානය සහ ඉඩම, නාගරික කොට්ඨාශ අංක 8 වේ පුත්තලම් පාරේ වරිපනම් අංක 96 හා 110 දරණ ෂෙල් පැට්රල් ගබඩාව, දේවගැති තුමන්ගේ නිවාසය හා ඉඩම ; විස්තරය : උළු සෙවිලි කල ගලෙන් බඳින ලද ස්ථිර දේවස්ථාන එකක්, ගලෙන් බඳින ලද ස්ථිර සීනු කණු එකක්, උළු සෙවිලි කල ගලෙන් බඳින ලද ස්ථිර ගෙවල් දෙකක්, තහඩු සෙවිලි කල ගලෙන් බඳින ලද පෙට්‍රල් ගබඩා එකක්, තහඩු සෙවිලි කල ගලෙන් බඳින ලද වැසිකිලි එකක්, පොල්අතු සෙවිලි කල ගලෙන් බඳින ලද වැසිකිලි එකක්, අවුරුදු 20 ක් වයසැති කොස්ගස් එකක්, අවුරුදු 15 ක් වයසැති දිවුල් ගස් දෙකක්, අවුරුදු 30 ක් වයසැති කොහොඹ ගස් තුනක්, අවුරුදු 10 ක් වයසැති කොහොඹ ගස් තුනක් ; හිමිකම් කියන අය : අතිගරු ලක්දාස ද මැල්, කුරුණෑගල පූජ්‍ය ප්‍රසාදි තුමා ; ප්‍රමාණය : අක්. 1, රූඩ්. 3, පර්. 25.5.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 පෙබරවාරි මස 19 වන දින පෙරවරු 10 ට අනුරාධපුර දිසාපති කාර්‍යාලයේ දී මා හමුවිය යුතුයි.

තව ද 1962 පෙබරවාරි මස 12 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඇන්. පී. විජයරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

කච්චේරිය,
අනුරාධපුරය, 62. 1. 10.
1-572

---

සඳහන් අංකය : එල්.එම්. 5871.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අටුලුගම් හා පනාවල් දෙකෝරළයේ, නැගෙනහිර පනාවල, පනාවල ගමේ පිහිටි, ඒ. 1093 දරණ මූලික සැලැස්ම.

**බිම් කට්ටි අංක : 1.**

නම : දිගනේ ඔව්ට නොහොත් සැසිබංගලාවත්ත ; විස්තර : අවුරුදු 20 පොල්ගස් 39යි, අවුරුදු 8 පොල්ගස් 76යි, අවුරුදු 3 පොල්ගස් 12යි, කොස්ගස් 10යි, පුවක් ගස් 9යි, කජු ගස් 4යි, දොඩම් ගස් 30යි, අඹගස් 2යි, ජම්නාරං ගස් 1යි, හොර ගස් 1 යි, කෙසෙල් පඳුරු 35යි, මුළුතැන්ගෙයක් සම්බන්ධිත ගෙයක් හා වැසිකිළියක්, මුළුතැන්ගෙයක් සහිත ගෙයක් ; අයිතිකරුවෝ : රුවන්වැල්ලේ වී. ඊ. මීදෙනිය මහත්මිය සහ පනාවල, වත්නි ආරච්චිල්ලාගේ ජේම්ස් අප්පුහාමි ; ප්‍රමාණය : අ...2, රූ. 0, ප. 04.1.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලුදෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 පෙබරවාරි මස 15 වැනි දින පෙරවරු 10ට දෙහිඕවිට, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලයේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1962 පෙබරවාරි මස 8 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ලෙනඩ් පනම්බලන,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරි.

කෑගල්ලේ කච්චේරිය,
1962 ජනවාරි මස 12 වැනිදාය.

1-591

---

## ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

මගේ අංකය ; ඇල්.ආර්.ඕ/ඒ.පී.ඇල්. 1257.
දිසාපතිගේ අංකය : ඇල්.ආර්.ඕ/46.

### දීමනා පත්‍ර ලැබීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳ ඉඩම් කච්චේරි දැනුම් දීමයි

මෙහි පහත විස්තර ඇති, රජයේ ඉඩම් දීමනා පත්‍රයක් පිට දීම සඳහා සුදුස්සකු තෝරා ගැනීම පිණිස 1962 පෙබරවාරි 10 වැනි දින පෙරවරු 10 ට, යාපනේ කච්චේරියේදී, ඉඩම් සංවර්ධන ආඥපනතේ ප්‍රකාර, ඉඩම් කච්චේරියක්, යාපනේ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් පවත්වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1948, ඉඩම් නිදහස් කිරීමේ රෙගුලාසිවල 3 වැනි රෙගුලාසියෙන් සහ 1942 අංක 61 දරන ඉඩම් නිදහස් කිරීමේ ආඥපනතේ 5(1) වැනි ඡේදයෙන්ද සංශෝධිත පරිදි, ඉහත සඳහන් ආඥපනතේ පළවැනි උපලේඛනයේ සඳහන් සියලුම කොන්දේසිවලට යටත්ව දීමනා පත්‍රය දෙනු ලැබේ.

3. සෑම ඉල්ලුම්කරුවෙක්ම පෞද්ගලිකව ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නොඑසේ නම් ඔහු වෙනුවට පෙනී සිටීම සඳහා, නියමිත බලය ලියවිල්ලකින් පවරා, යම්කිසිවෙකු පත්කල හැක.

4. ඉඩම් කච්චේරිය පිළිබඳ විමසිලි දිසාපතිතුමාගෙන් ලබාගත යුතුයි.

අ. ච. ල. අභයසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්.

කොළඹ, 1962 ජනවාරි 10.

### ඉහත සඳහන් ඉඩමේ විස්තර

ඒ. 1635 දරන මූලික පිඹුර — ගම : කෝපායි උතුර

**කට්ටි අංකය : 1.**

බලපත්‍ර හෝ දීමනාපත්‍ර ඉල්ලුම්කරුගේ නම : රාමු කාර්තිගේසු. නැගෙනහිර උරුම්පිරායි උරුම්පිරායි ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 05.5.

1-509

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. 7782.

## රජයේ ඉඩම් රෙගුලාසියේ 21(2) යටතේ කෙරෙන නිවේදනයයි

කොළඹ නාගරික සීමාව තුළ ඌරුගොඩවත්තේ පිහිටි මුළු ප්‍රමාණය අ. 0, රූ. 1, ප. 13.8ක් ඇති ඒ 1,546 මූලික පිඹුරේ කැබැලි අංක 1 සහ 2 යනුවෙන් සඳහන් රජයේ බිම් තීරයක්, තමාට විකුණන මෙන්, කොළඹ 14, ශාන්ත ජෝෂප් පෙදෙසේ නිවැසි ජේ. ඊ. ඇම්. ද සේරම් මහතා මගෙන් ඉල්ලා ඇත.

2. කලෙක ශාන්ත සෙබස්තියන් ඇලේ කොටසක්ව තිබූ මෙම කැබලි මෙතැනින් ඇල වෙනත් දෙසකට හැරවීමෙන් පසුව—දැන් මුළුමනින්ම ඉල්ලුම්කරුගේ පෞද්ගලික ඉඩම් වලින් වටවී තිබෙන අතර, මෙම ඉඩමෙන් තොරව එහි ඇතුල්වීමට වෙනත් මාර්ග පහසුවක් නැත. මෙහි පිහිටීම, හැඩහුරුකම සහ වගුරු සවභාවය හේතුවෙන් මෙය රජයේ හෝ වෙනත් කිසි මහජන කටයුත්තකට පහසුවෙන් යෙදවිය නොහැක. එබැවින්, ඉල්ලුම්කරුට මෙම කැබැලි රු. 2,250ක මුදලකට විකිණීමට අදහස් කෙරේ.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම මෙසේ නොවිකිණිය යුතු යයි පිළිගත හැකි හේතුන් ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉඩම මෙලෙස විකුණනවා ඇත.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1962 ජනවාරි මස 18 දින,
කොළඹදීය.

1-535

---

යොමු අංකය : එල්. එල්./3.

## 1962 වර්ෂය සඳහා දුම්කොළ වගා කිරීම පිණිස, කොඩ්ඩියාර් පත්තුවේ රජයේ ඉඩම් බදුදීම—ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

මහවැලි ගඟ ඉවුරේ පිහිටි දුම්කොළ වගාවට යෝග්‍ය කොඩ්ඩියාර් පත්තුවේ රජයේ ඉඩම්වල බද්ද, 1962 කේ පෙබරවාරි මස 2 වැනි දින පෙරවරු 10.00 ට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මූතූර් හි, කොඩ්ඩියාර් පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේදී, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉඩම් කැබලි විස්සක් (20) කොඩ්ඩියාර් පත්තුවේ ප්‍රාදේශීය ජනතාව අතර විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. සෑම ඉල්ලුම්කරුවකුම, තමා කොඩ්ඩියාර් පත්තුවේ ස්ථිර පදිංචිකරුවකුය යන බවට, කොඩ්ඩියාර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ඉල්ලුම්කරුවකුම, පුද්ගලිකව හෝ විධිමත් ලෙස පත් කරනු ලැබූ නියෝජිතයෙකු හෝ ඉහත කී ස්ථානයට ඉහත කී වේලාවට පැමිණ සිටිය යුතුය. එම නියෝජිතයා විසින්, විකිණීම ආරම්භ වීමට ප්‍රථමයෙන්, පරීක්ෂා කිරීම සඳහා බලකඩදාසි ඉදිරිපත් කළ යුතුය.

4. කිසියම් ඉල්ලීමක් භාර ගැනීමට ප්‍රථමයෙන්, ඉල්ලීම ඉදිරිපත් කරන්නාගේ නීර්ව්‍යාජත්වයත්, බද්දේ කොන්දේසි වලට අනුව කටයුතු කිරීමේ හැකියාවත් ගැන දිසාපති තුමා සතුටට පත්විය යුතුය. තමා එසේ සතුටට පත් නොවන්නේ නම් දිසාපති තැන විසින් එවැනි කිසියම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කොට, ඉල්ලීමක් ඉදිරිපත් නොකළ ලෙස සළකා, විකිණීම කරගෙන යනු ලැබේ.

5. සෑම බද්දක්ම අවුරුදු එකක කාල පරිච්ඡේදයකට පමණක් සීමාවේ. ඉල්ලීම් කළ යුත්තේ බදු මුදලේ සිටය. අක්කරයක් සඳහා වූ අඩුම බදු මුදලවන රුපියල් 15 ට අඩුවෙන් කෙරෙන කිසිම ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

6. ඉහත සඳහන් ප්‍රදේශයේ පසුගිය අවුරුදු වලදී, නීති විරෝධි ලෙස දුම්කොළ වගා කිරීම නිසා මවිසින් පනවන ලද දඩ මුදල් නොගෙවූ කිසිවකුට, මොනම කරුණක් නිසාවත්, මෙම වෙන්දේසියේදී ඉල්ලුම් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7. සෑම ඉල්ලුම් කරුවකුම, විකිණීම අවසන් වූ වහාම, එම ඉල්ලීමේ සම්පූර්ණ මුදල ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැනට ගෙවිය යුතුය.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්ඩ්,
ත්‍රිකුණාමලයේ රජයේ දිසාපති.

1962. 1. 10 වැනිදින,
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

1-558/1

---

යොමු අංකය : එල්. එල්/3.

## 1962 කේ වර්ෂය සඳහා දුම්කොළ වගා කිරීම පිණිස, කොඩ්ඩියාර් පත්තුවේ රජයේ ඉඩම් බදුදීම—ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

මහවැලි ගඟ ඉවුරේ පිහිටි, දුම්කොළ වගාවට යෝග්‍ය, කොඩ්ඩියාර් පත්තුවේ රජයේ ඉඩම්වල බද්ද 1962 ඉක් පෙබරවාරි 5 වැනිදින පෙරවරු 10.00 ට ත්‍රිකුණාමල කච්චේරියේදී, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. සෑම ඉල්ලුම්කරුවකුම පුද්ගලිකව හෝ විධිමත් ලෙස පත් කරනු ලැබූ නියෝජිතයෙකු හෝ ඉහත කී ස්ථානයට ඉහත කී වේලාවට පැමිණ සිටිය යුතුය. එම නියෝජිතයා විසින්, විකිණීම ආරම්භ වීමට ප්‍රථමයෙන්, පරීක්ෂා කිරීම සඳහා, බලකඩදාසි ඉදිරිපත් කළ යුතුය.

3. කිසියම් ඉල්ලීමක් භාර ගැනීමට ප්‍රථමයෙන්, ඉල්ලීම ඉදිරිපත් කරන්නාගේ නිර්ව්‍යාජත්වයත්, බද්දේ කොන්දේසි වලට අනුව කටයුතු කිරීමේ හැකියාවත් ගැන දිසාපති තැන සතුටට පත්විය යුතුය. තමා එසේ සතුටට පත් නොවන්නේ නම් දිසාපති තැන විසින් එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කොට, ඉල්ලීමක් ඉදිරිපත් නොකළ ලෙස සළකා, විකිණීම කරගෙන යනු ලැබේ.

4. සෑම බද්දක්ම අවුරුදු එකක කාල පරිච්ඡේදයකට පමණක් සීමාවේ. ඉල්ලීම් කළ යුත්තේ බදු මුදලේ සිටය. අක්කරයක් සඳහා වූ අඩුම බදු මුදලවන රුපියල් 15 ට අඩුවෙන් කෙරෙන කිසිම ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

5. ඉහත සඳහන් ප්‍රදේශයේ පසුගිය අවුරුදු වලදී, නීති විරෝධි ලෙස දුම්කොළ වගා කිරීම නිසා මවිසින් පනවන ලද දඩ මුදල් නොගෙවූ කිසිවකුට, මොනම කරුණක් නිසාවත්, මෙම වෙන්දේසියේදි ඉල්ලුම් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6. සෑම ඉල්ලුම්කරුවකුම, විකිණීම අවසන් වූ වහාම, එම ඉල්ලීමේ සම්පූර්ණ මුදල ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැනට ගෙවිය යුතුය.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්ඩ්,
ත්‍රිකුණාමලයේ රජයේ දිසාපති.

1962. 1. 10 වැනිදින,
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

1-558/2

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටි පොල්වත්තේ පලදාව ගැනීමේ අයිතිය බදුදීම

කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටියාවූ ද, සියල්ලක්ම වාගේ පල දරන ගස් 38,000කින් පමණ යුක්තවූද, සම්පූර්ණයෙන් අක්කර 1000ක් පමණවූ පොල්වත්තේ පලදාව ලබාගැනීමේ අයිතිය පහත දැක්වෙන කොන්දේසි යටතේ 1962 මාර්තු 1 වන දින සිට අවුරුදු 10කට බදුදීම සඳහා, (මෙහි මින්මතු ආණ්ඩුවේ ඒජන්ත යැයි සඳහන් කෙරෙන) කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් ටැන්ඩර් බාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### කොන්දේසි

1. ටැන්ඩර් කැඳවනු ලබන්නේ වාර්ෂික බදුමිල සඳහාය.

2. කොළඹ කච්චේරියෙන් ලබාගත හැකි ෆෝර්මවල ලියා ටැන්ඩර් ඉදිරිපත් කළයුතුයි. ටැන්ඩර් ෆෝර්මයක් ඉල්ලුම්කර සිටින්නකු පළමුකොට කොළඹ කච්චේරියේ රු. 250ක් තැන්පත් කොට එහි කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිතොත් විනා ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු නොලැබේ. ඉල්ලුම්කරු ටැන්ඩරය ඉදිරිපත් කර ඇත්තේ ව්‍යාජ අදහසින් යයි හෝ ඉල්ලුම්කරු නිසා ආණ්ඩුවට අනවශ්‍ය වියදම් නොහොත් අපහසුකම් සිදුවිණැයි හෝ ආණ්ඩුවේ ඒජන්ත විසින් සලකනු ලබතොත් විනා, මෙකී තැන්පත් මුදල ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ඇත. වෙන කිසිදු ෆෝර්මයක ලියා එවන ටැන්ඩර් සැලකිල්ලට නොගනු ලැබේ.

3. "කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදාව පිහිටි පොල්වත්තේ පලදාව ලබාගැනීමේ අයිතිය බදුගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන ටැන්ඩරය" යනුවෙන් කවරයේ පිටින් ලියා, සීල් තබා ඉදිරිපත් කරන ටැන්ඩර, 1962 පෙබරවාරි 12 වන දින දවල් 12 දක්වා කොළඹ කච්චේරියේදී බාරගනු ලැබේ. එදින එවේලාවට ඒවා විවෘත කරනු ලබන්නේය. ටැන්ඩර විවෘත කරනවිට සියලුම ටැන්ඩර්කරුවන් තමන්ම පැමිණ සිට හෝ තමන් වෙනුවෙන් යථා පරිදි පිළිගත් නියෝජිතයෙකු එවා හෝ තමන් සැබෑ අදහසින් ම ටැන්ඩර් ඉදිරිපත් කර ඇති බවට ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්කළ යුතුය.

4. පිළිගත් ටැන්ඩරය ඉදිරිපත් කළ ටැන්ඩර්කරු විසින්—

(අ) තමාගේ ටැන්ඩරය පිළිගනු ලැබූ වහාම, මාස තුනක කුලියට සමාන මුදලක් ඇප වශයෙන් ආණ්ඩුවට ගෙවිය යුතුයි. මෙම මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ මෙහි සඳහන් වන කොන්දේසි යටතේ නොහොත් බදු කොන්දේසි කිසිවක් කඩකිරීම නිසා ආණ්ඩුවේ ඒජන්ත විසින් රාජසන්තක කරතොත් විනා, බද්ද අවසානවූ විට හෝ ඊට කලින් එය අවසන් කරනු ලැබුවහොත් එවිට හෝ එකී පිළිගත් ටැන්ඩරය ඉදිරිපත් කළ ටැන්ඩර්කරුට ආණ්ඩුව විසින් ආපසු ගෙවනු ඇත.

(ආ) බද්ද පිළිබඳ බහු පාක්ෂික ඔප්පුව තමා වෙත ඉදිරිපත් කරනු ලැබ දින 14ක් ඇතුලත ඊට අත්සන් කළයුතුයි.

ඉහත දක්වූ (අ) සහ (ආ) යන ඡේදයන් ටැන්ඩර්කරු විසින් පිළිපදිනු නොලැබුවහොත් මෙම අයිතිය විකිණීම අවලංගු කිරීමටත්, එම ටැන්ඩර්කරු විසින් ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එය රාජසන්තක කිරීමටත් ආණ්ඩුවේ ඒජන්තට පිළිවන.

5. මෙම බද්දට ඇතුළත්වන කොන්දේසි අතර, පහත දක්වෙන කොන්දේසිද වන්නේ ය :—

(i) බදුගැණුම්කරු විසින්, එක් එක් කාර්තුවේ බදු කුලිය ඒ ඒ කාර්තුවේ 1 වනදාට හෝ ඊට මත්තෙන් කොළඹ කච්චේරියේදී ආණ්ඩුවේ ඒජන්තට ගෙවිය යුතුයි.

(ii) යම් කාර්තුවක බදු කුලිය ගෙවිය යුතු දිනයෙහි එම මුදල සම්පූර්ණයෙන් නොගෙවන්නේ නම්, ඉතිරි කොටස ගෙවා නිමකරනතුරු බදුගැනුම්කරු විසින් හිඟ හිටවා ඇති බදු කුලිය වෙනුවෙන් වර්ෂයකට සියයට පහ බැගින් පොලී ගෙවිය යුතුය.

(iii) ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු සියලුම වරිපනම්, බදු, වෙනත් තක්සේරු හා ගෙවීම් බදුගැණුම්කරු විසින් ගෙවිය යුතුය.

(iv) බදු ගැණුම්කරු විසින් ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්වන පරිදි ඉඩමේ මායිම් වැට තමාගේම වියදමින් මනා තත්ත්වයකින් තබාගත යුතුයි.

(v) බදු ගැණුම්කරු තමාගේම වියදමින් ඉඩමේ සියලුම ආණ්ඩුවේ මායිම් ලකුණු ද, මායිම් ද, යොදා ඒවා මනා තත්ත්වයෙන් තබාගත යුතුයි.

(vi) බදුගැනුම්කරු ආණ්ඩුවේ ඒජන්තගෙන් ලියවිල්ලක් මගින් කලින් අවසර ලබානොගෙන ඉඩමේ ඇති ගස්කොලන් කැපීම, ඉවත් කිරීම හෝ කවර ආකාරයකින් වුවද, ඒවාට අලාභහානි කිරීම හෝ නොකළ යුතුය.

(vii) බදුගැණුම්කරු ආණ්ඩුවේ ඒජන්තගෙන් ලියවිල්ලක් මගින් කලින් අවසර ලබාගෙන විනා ඉඩමෙන් වැලි හෝ බොරලු ඉවත් කරගෙන නොයා යුතුය.

(viii) බදුගැණුම්කරු ආණ්ඩුවේ ඒජන්තගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමැතිය ලබා නොගෙන කිසිම තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි ආදියක් ඉඩමෙහි නොතැනිය යුතුය.

(ix) බදුගැණුම්කරු ඉඩම් කොමසාරිස්ගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමතිය ලබා නොගෙන බද්ද සම්බන්ධයෙන් තමාට ඇති අයිතිවාසිකම් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදුදීම හෝ උකස් කිරීම හෝ වෙනත් අයුරකින් අත්මිදවීමක් හෝ නොකළයුතුයි.

(x) බදුගැණුම්කරු මෙම බද්ද යටතේ සිය අයිතිවාසිකම් පාවිච්චි කිරීමේදී, සේවා කටයුතු සඳහා හෝ ඉඩමේ තත්ත්වය පරීක්ෂාකිරීම සඳහා හෝ ඉඩමේ කවර කොටසක් වුවද පාවිච්චියට ගැනීමටත් ඊට ඇතුළුවීමටත් රාජකීය ලංකා ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියා වෙත පැවරී ඇති බලයට යටත්වන්නේ ය.

(xi) රාජකීය ලංකා ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියාට මෙම ඉඩමේ කවර කොටසක් මෙන්ම සෑම කොටසක්මද සේවා කටයුතු සඳහා පාවිච්චියට ගැනීමේ අයිතිය තිබේ. බදුගැණුම්කරු මෙම අයිතියට බාධා නොකළ යුතුය.

(xii) තමාගේ කොන්ත්‍රාත්තුව එදිනෙදා වශයෙන් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් කටුනායක රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියෝජ්‍ය ප්‍රධාන වැඩ නිලධාරියා විසින් නිකුත් කැරෙන සියලුම උපදෙස් බදුගැණුම්කරු විසින් පිළිපැදිය යුතුයි. යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන වැඩ නිලධාරියා සහ බදුගැණුම්කරු අතර මතභේදයක් පැන නැගුණහොත් එම මතභේදයට හේතුවූ කාරණය ආණ්ඩුවේ ඒජන්ත වෙත ඉදිරිපත් කළ යුතුය. ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

(xiii) සුරක්ෂිතතාව සම්බන්ධයෙන් කටනායක රාජකීය ලංකා ගුවන් හමුදවේ අණදෙන නිලධාරියා විසින් නියම කරනු ලබන සියලුම විධිවිධානයන්ට අනුකූලව බදුගැණුම් කරුද, ඔහුගේ නියෝජිතයන්ද, සේවකයන්ද ක්‍රියාකළ යුතුය. එවැනි විධිවිධානයන් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා බදුගැණුම්කරු රාජකීය ලංකා ගුවන් හමුදවේ නියෝජ්‍ය ප්‍රධාන වැඩ නිලධාරියාගෙන් විමසිය යුතුය.

(xiv) යම් යම් සේවා කටයුතු හෝ සුරක්ෂිතතා කටයුතු හේතු කොටගෙන තමාගේ බද්ද භුක්ති විඳීමට තාවකාලිකව බාධා, පැමිණීම වෙනුවෙන් වන්දියක් හෝ සහනයක් ඉල්ලා සිටීමට බදුගැණුම්කරුට අයිතියක් නැත්තේ ය.

(xv) වත්ත මනා තත්ත්වයෙන් තබා ගැනීම සඳහා බදුගැණුම්කරු විසින් පහත දක්වෙන වැඩ පිළිවෙල අනුගමනය කළයුතුය :—

(අ) ආණ්ඩුවේ ඒජන්ත විසින් නියමකරනු ලබන පෝර ඔහු නියම කරන ආකාරයට යොදා බදුගැණුම්කරු විසින් වාර්ෂිකව ගස් පෝර කළයුතුය.

(ආ) බදුගැණුම්කරු විසින්, පහත් වගුරු භූමියෙහි වූ පොල්ගස් පේලි අතර, ආණ්ඩුවේ ඒජන්ත හෝ ආණ්ඩුවේ ඒජන්ත විසින් යථාපරිදි බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු නියම කරන පරිදි, අගල් කැපිය යුතුය. තවද ඔහු ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්වන පරිදි එම අගල් පිරිසිදුවද වල් පැලෑටි වලින් තොරව ද තැබිය යුතුයි.

(ඇ) බදුගැණුම්කරු ඉඩමේ භුක්තිය බාරගෙන මාස හයක් ඇතුලත, ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්වන පරිදි මුළු ඉඩමේම වල්පැලෑටි සම්පූර්ණයෙන් ශුද්ධකොට එහි ඇති පොල් කඳන්, කොටන් හා වෙනත් කුණු රොඩු නැතිකර දැමිය යුතුය.

(ඈ) බදුගැණුම්කරු විසින් ඉඩමේ ඇති වල්පැලෑටි හා ලඳුකැලෑව උදුරා දමා හෝ බිම් මට්ටමට කපා දමා එහි ඇති හෝ සියලුම ගස් කොටන්, ලෙලි, වියලී වැටුනු කොළ අතු ආදිය හා වෙනත් ගස් කුණු රොඩු ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්වන පරිදි නැතිකර දැමිය යුතුයි.

(ඉ) බදුගැණුම්කරු, ආණ්ඩුවේ ඒජන්ත විසින් නියම කරනු ලබන කාලය ඇතුලත, නියම කරන වගීයේ පැල ගෙන නියම කරන ආකාරයට, ඉඩමේ ඇති හිස් තැන් 10,000හී සිටුවිය යුතුය.

(ඊ) බදුගැණුම්කරු ආණ්ඩුවේ ඒජන්ත, සෑහීමට පත්වන පරිදි (ගුවන් පොළ හැර) සම්පූර්ණ ඉඩම තැටි පෝරු ගෑ යුතුය.

(xvi) බදුගැණුම්කරු ඉඩම ඇතුලත පොල් ලෙලි නොගැසිය යුතුය. තවද, පොල්කඩා පැය හතලිස් අටක් ඇතුලත ඔහු ගෙඩි සියල්ලම ඉවත් කරගෙන යා යුතුය.

(xvii) ඉඩමේ පලදාව රැකබලාගැනීමටද, සොරුන්ගෙන් ගින්නෙන් හා වෙනත් අයුරින් සිදුවන අලාබහානි වළක්වා ලීමටද අවශ්‍ය විධිවිධාන බදුගැණුම්කරු විසින්ම යෙදිය යුතුය. තවද, මේ වෙනුවෙන් රජයෙන් යම් වන්දියක් ඉල්ලා සිටීමට ඔහුට කිසිදු අයිතියක් නොලැබෙනු ඇත.

(xviii) බදුගැණුම්කරු විසින් ගෙඩි කැඩීම, වගා කිරීම, ඉඩම මනා තත්ත්වයෙන් පවත්වා ගැනීම, වල් පැලෑටි නෙලීම හා අළුතෙන් පැල සිටුවීම යන මෙම්වා මනා කෘෂිකාර්මික ක්‍රම අනුවත් ආණ්ඩුවේ ඒජන්ත සෑහීමට පත්වන පරිදිත් කළ යුතුය.

(xix) කවර විටකදී හෝ ඉඩමට ඇතුළු වීමටද එය පරීක්ෂාකිරීමට ද ආණ්ඩුවේ ඒජන්තට හෝ ඔහු විසින් යථාපරිදි බලය පවරනු ලැබූ නිලධාරියෙකුට බදුගැණුම්කරු විසින් ඉඩදිය යුතුය.

(xx) බද්ද අවසන් වන්නට කලින් මෙම මුළු ඉඩම හෝ ඉන් කොටසක් හෝ ආණ්ඩුවට අවශ්‍ය වී නම් ලියවිල්ලකින් මාසයක් කල්තියා දැනුම් දුන්විට බදුගැණුම්කරු විසින් මුළු ඉඩම හෝ එම කොටස හෝ ආණ්ඩුවේ ඒජන්තට ආපසු භාරදිය යුතුයි. එසේ වූ විට, තමා විසින් දැනටමත් ගෙවා ඇති බදු කුලියෙන් සමානුපාතික කොටසක් ආපසු ලැබීමටද බද්දේ ඉකුත්නොවූ කාලසීමාව වෙනුවෙන් තමා විසින් ගෙවියයුතු බදු කුලිය සමානුපාතිකව අඩුකරවා ගැනීමටද හිමිකමක් බදුගැණුම්කරුට ඇත්තේ ය.

(xxi) ඉඩමේ වැඩකිරීම සඳහා බදුගැණුම්කරු විසින් ලංකාවේ රට වැසියන් පමණක් යෙදවිය යුතුයි. සුරක්ෂිතභාවය හෝ වෙනත් හේතූන් උදෙසා යම් අයෙකු හෝ යම් යම් අය සේවයේ යෙදවීම නුසුදුසු යැයි ආණ්ඩුවේ ඒජන්ත විසින් සලකනු ලැබෙතොත් එවැන්නන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් විරුද්ධවීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත වෙත තබාගනු ලැබේ. මෙසේ කිසිවකු ගැන විරුද්ධතාව ප්‍රකාශ කරනු ලැබුවහොත් බදුගැණුම්කරු එම අයගේ සේවය නතර කළ යුතුය.

(xxii) බදුගැණුම්කරුගේ සේවකයකු විසින් හෝ එවැනි සේවකයකු සම්බන්ධයෙන් හෝ කම්කරු වන්දි ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලින් බදුගැණුම්කරු විසින් ආණ්ඩුව නිදහස් කළයුතුය.

(xxiii) බදුගැණුම්කරු විසින් බද්දේ කොන්දේසිවලින් යමක් කඩකළහොත් කිසිදු වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය ආපසු ගැනීමටත්, බදුගැණුම්කරුගේ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ රාජ සන්තක කිරීමටත් ආණ්ඩුවේ ඒජන්තට බලය ඇත්තේය.

(xxiv) වැඩි දියුණු කිරීම් වෙනුවෙන් හෝ වෙනත් කිසිම කරුණක් වෙනුවෙන් හෝ ආණ්ඩුවෙන් වන්දි ලැබීමේ කිසිම හිමිකමක් බදුගැණුම් කරුට නොලැබෙන්නේය.

6. යම් ටැන්ඩරයක් හෝ ටැන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

7. කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තගෙන් ඉල්ලුම්කර සිටීමෙන් බද්ද හා ටැන්ඩර කොන්දේසි පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැක.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1962 ජනවාරි මස 12 වෙනි දින,
කොළඹ කච්චේරියේදීය.

1-588

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි